# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1621/19 - 2009 සැප්තැම්බර් 30 වැනි බදාදා - 2009.09.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

විධාන අංක 30

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**
**10(1) වැනි වගන්තිය යටතේ විධානය**

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10(1) වැනි වගන්තිය යටතේ අධිකාරිය වෙත පැවරී ඇති බලතල අනුව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් පහත සඳහන් කරනු ලබන ද්‍රවිකෘත පෙට්‍රෝලියම් වායු අයිතමයන් (Liquefied Petroleum Gas) (LPG) සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කර ඇති ප්‍රමිති, පිරිවිතර සහ භාවිත සංග්‍රහවලට අනුකූල වන්නේ නම් මිස කිසිම නිෂ්පාදකයකු, ආනයනකරුවකු, බෙදාහරින්නකු හෝ වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් එකී ද්‍රවිකෘත පෙට්‍රෝලියම් වායු අයිතමයන් (Liquefied Petroleum Gas) (LPG) නිපදවීම, ආනයනය කිරීම, බෙදාහැරීම, ගබඩා කිරීම, විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට මෙයින් විධාන කරනු ලැබේ.

මෙම විධානය වර්ෂ 2010 අප්‍රේල් මස 01 වැනි දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

රූමි මර්සූක්,
සභාපති.

2009 සැප්තැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

10-520


1A - G 11784— 480 (2009/09)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.